පාර්ලිමේන්තුවේ පුස්තකාලය
1979-1-17

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 10 දරන පඩි පාලක සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1978 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 30 යි    තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1978 අංක 10 දරන පඩි පාලක සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

එල්.ඩී.—ඕ. 51/77

**පඩි පාලක සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1978 අංක 10 දරන පඩි පාලක සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*3 ආ වන සහ 3 ඇ වන අලුත් වගන්ති 136 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන පඩි පාලක සභා ආඥාපනතේ (1971 අංක 1 දරන නීවාඩු නියෝග මගින් ඇතුළත් කරන ලද) 3(ආ) වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

*"වැටුප් පිළිබඳ විස්තර කම්කරුවා වෙත හෝ ඔහුගේ වෘත්තීය සමිතිය වෙත හෝ සැපයිය යුතු බව.*

3ඈ. 3 වන වගන්තිය යටතේ වැටුප් වාර්තාවක් පවත්වා ගෙන යන හෝ පවත්වා ගෙන ගොස් ඇති සෑම සේවායෝජකයකු විසින් ම, කම්කරුවකු විසින් හෝ ඔහු අයිති වෘත්තීය සමිතිය විසින් හෝ කරනු ලබන යම් ඉල්ලීමක් මත ඒ කම්කරුවාට ගෙවන ලද වැටුප් පිළිබඳ සියලු විස්තර නියමිත ආකෘතියේ සැපයීම හෝ සපයනු ලැබීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

*ඇතැම් අවස්ථාවල හිඟ වැටුප් අය කර ගැනීම.*

3ඉ. (1) යම් කර්මාන්තයක යම් කම්කරුවකුගේ සේවායෝජකයකු විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තබා ගැනීමට නියමිත වැටුප් වාර්තාව පවත්වා ගෙන යාම හා, එම කර්මාන්තය කරගෙන යන ස්ථානයේ එය තබා ගැනීම පැහැර හැර ඇති හෝ එම වාර්තාව පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස එම වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ නියම කරනු ලැබූ විට, එසේ ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ අවස්ථාවක, මේ ආඥාපනත යටතේ එම කම්කරුවාට, අවස්ථාවෝචිත පරිදි, ගෙවිය යුතු වැටුප් හෝ අඩුවෙන් ගෙවන ලද වැටුප් තමාට ලැබී ඇති වාචික හා ලේඛනමය යන දෙවර්ගයේ ම සියලු සාක්ෂි මත තක්සේරු කිරීමට කොමසාරිස්වරයාට මෙයින් බලය පවරනු ලබන අතර එවැනි යම් වැටුප් ගෙවීමෙහි ලා පැහැර හැරීමක් කර ඇති අවස්ථාවක (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු ගෙවීමට යටත් වන්නේ යම් මුදලක් ද ඒ මුදල ගෙවීම ඔහු විසින් පැහැර හරින හා මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධාන යටතේ ඒ මුදල අයකර ගැනීම කළ නොහැකි බව සහ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් එසේ ලැබිය යුතු මුදල පිළිබඳ

විස්තර සහ ගෙවීම පැහැර හරින සේවායෝජකයාගේ නම හා ඔහු පදිංචි ස්ථානය ද දක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටා තිබෙන කොට්ඨාසය විෂය යෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ලැබිය යුතු මුදල අය කර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු ඔහුට විරුද්ධව පවත්වා ගෙන යනු නොලැබිය යුත්තේ කුමක් නිසාදැයි හේතු දක්වීම පිණිස එවිට මහේස්ත්‍රාත්වරයා විසින් එම සේවායෝජකයා තමා ඉදිරියට කැඳවිය යුතු අතර සෑහෙන හේතු දක්වීම පැහැර හරිනු ලැබූ විට, ඒ මුදල ඒ සේවායෝජකයා වෙත ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එය අය කරනු ලැබිය යුතු ය. එසේ අය කර ගනු ලැබූ සෑම මුදලක් ම කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක වූ යම් ප්‍රකාශයක නිරවද්‍යතාව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුතුවල දී අධිකරණය විසින් ප්‍රශ්න කිරීම හෝ පරීක්ෂා කිරීම හෝ නොකළ යුතු ය. තව ද ඒ අනුව, ඒ සහතිකයේ වූ යම් ප්‍රකාශයක නිරවද්‍යතාව සලකා බැලීම හෝ තීරණය කිරීම පිණිස මේ වගන්තියේ ඇති කිසිවකින් අධිකරණයට බලය දෙනු නොලැබිය යුතු අතර ගෙවීම පැහැර හැරි සේවායෝජකයාගෙන් (1) වන උපවගන්තිය යටතේ අය විය යුතු මුදල් ප්‍රමාණය විධිමත් ලෙස ගණන් බලන ලද බවට සහ ඒ මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති බවට කොමසාරිස්වරයාගේ සහතිකය ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මේ ආඥාපනතේ මේ කොටසේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් කරන අතර—

(අ) එම වරද ප්‍රථම වතාවට කරන ලද වරදක් වන අවස්ථාවක රුපියල් එක් සියයකට අඩු නොවූ ද රුපියල් දෙසිය පණහක් නොඉක්මවන්නා වූ ද දඩයකට ;

(ආ) එම වරද දෙවන වතාවට කරන ලද වරදක් වන අවස්ථාවක රුපියල් දෙසිය පණහකට අඩු නොවූ ද රුපියල් පන්සියයක් නොඉක්මවන්නා වූ ද දඩයකට ; සහ

(ඇ) එම වරද තදනන්තර වරදක් වන අවස්ථාවක රුපියල් පන්සියයකට අඩු නොවූ ද රුපියල් එක් දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ මාස හයක් නොඉක්මවන

කාලයක් දෙද ආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම් යන දඬුවම් දෙකට ම හෝ

ඔහු යටත් විය යුතු ය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (3) පඩි පාලක සභාවක් පිහිටුවන ලද දින සිට එක් අවුරුද්දක් වූ කාලසීමාවක් ඉකුත්වීමට පෙර (1) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි, සාමාන්‍ය අවම කාල අනුප්‍රමාණයක් නිශ්චය කිරීමට ඒ සභාවට නොහැකි වන කවර හෝ අවස්ථාවක, සභාව විසින් ඒ බව අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය. සාමාන්‍ය අවම කාල අනුප්‍රමාණයක් නිශ්චය කිරීමට නොහැකි වන්නේ යම් අවස්ථාවක් සම්බන්ධයෙන් ද ඒ අවස්ථාව සම්බන්ධයෙන් වන තාක් දුරට අමාත්‍යවරයා විසින් ඒ අනුප්‍රමාණය නිශ්චය කිරීමෙන් එම සභාව නිදහස් කරමින් 33 වන වගන්තිය යටතේ නියමයක් කළ හැකි ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (ආ) යම් කර්මාන්තයක් සඳහා පිහිටුවන ලද පඩි පාලක සභාවක් විසින්, යම් හේතුවක් නිසා, එම සභාව පිහිටුවන ලද දින සිට එක් අවුරුද්දක් වූ කාලසීමාවක් ඉකුත් වීමට පෙර, යම් අවස්ථාවක් සම්බන්ධයෙන්, (එම සභාව විසින් 20 (3) වන වගන්තිය යටතේ අවස්ථාව සම්බන්ධයෙන් වාර්තා කර ඇත ද නැත ද) සාමාන්‍ය අවම කාල අනුප්‍රමාණයක් නිශ්චය කර නොමැති බව ; ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව මිස සහ වරද සිදු කිරීමෙන් අවුරුදු හයක් ඇතුළත මිස, නඩු පැවරිය නොහැකි බව.

60. මේ ආඥාපනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන්—

(අ) කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමතය අතිව මිස, සහ

(ආ) වරද සිදු කිරීමෙන් අවුරුදු හයක් ඇතුළත මිස

කිසිම නඩුවක් යම් අධිකරණයක පවරනු නොලැබිය යුතු ය. ".